# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.10.21 පැය 0615 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1921 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. වෙඩි තබා බිය ගැන්වීමේ අපරාධයකට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2025.10.18 වන දින ගනේමුල්ල පොලිස් ස්ථානයට වාර්තා වි තිබූ රාත්‍රී කාලයේ නිවසක් අසලට පැමිණ වෙඩි තබා බිය ගැන්වීමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය විසින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව එම කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන සිදු කර 2025.10.20 වන දින දහවල් කාලයේ මාකවිට හා තම්මිට ප්‍රදේශවලදී මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 26 මිලිග්‍රෑම් 510 ක් සමග හා තවත් සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 19 ක් හා අපරාධයට යොදා ගනු ලැබූ යතුරුපැදියක්ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 28 හා 33 වයස්වල පසුවන මාකවිට ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද බීඩි කොළ තොගයක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - කල්පිටිය පොලිස් ස්ථානය.**

2025.10.20 වන දින රාත්‍රී කාලයේ කල්පිටිය පොලිස් වසමේ සලාමත්පුරම් ප්‍රදේශයේදී කල්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමකට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදු කර තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද බීඩි කොළ කිලෝ 626 ක් අඩංගු පාර්සල් 20 ක් නිවසක සඟවා තිබියදී සැකකරුවෙකු සමග අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 20 ක් වන සලාමත්පුරම්, තලවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **වන අලියෙකු පහරදීමෙන් කාන්තාවක් මියයාම - වව්නතිව් පොලිස් වසම.**

2025.10.20 වන දින අළුයම් කාලයේ වව්නතිව් පොලිස් වසමේ වාදකල්මඩු ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීම හේතුවෙන් කාන්තාවක් මියගොස් ඇති බවට ලද තොරතුරක් මත වව්නතිව් පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 58 ක් වූ පන්චේන, වව්නතිව් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය තම නිවසේ ඉදිරිපිට සිටියදී මෙලෙස වන අලි ප්‍රහාරයකට ලක්ව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වි ඇත. වව්නතිව් පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **දිය අනතුරකින් කාන්තාවක් බේරා ගැනීම - ඒත්තුකාල පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.**

2025.10.20 වන දින සවස් කාලයේ ඒත්තුකාල පොලිස් වසමේ ඒත්තුකාල වෙරළ තිරයේදී කාන්තාවක් දියඹ දෙසට ගසා ගෙන යමින් සිටියදී ඒත්තුකාල පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් කොස්තාපල් 96768 කෝරලගේ, පොලිස් කොස්තාපල් 99177 ලක්ශාන්, පොලිස් කොස්තාපල් 105320 විජේසිංහ හා පොලිස් කොස්තාපල් 106976 සමිත යන නිලධාරීන් විසින් ඇය බේරා ගෙන මූලික ප්‍රතිකාර ලබා දී වැඩිදුර ප්‍රතිකාර සඳහා මීගමුව රෝහල වෙත ඇතුලත් කර ඇත.

**අනතුරට ලක්වූ කාන්තාව වයස අවුරුදු 49 ක් වූ වටිනපහ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**